සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 155-174
ISSN 1800-1459

# වාණිජ අවකාශයේ දළදා තේවාවː සමාජ මානව විද්‍යාත්මක විශ්ලේෂණයක්

**සුසන්ත රස්නායක, සමන් හඳරාගම හා ඉන්දිකා අබේරත්න**

සමාජ විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.
සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය.
රඹුක්කන ප්‍රදේශීය මහලේකම් කාර්යාලය, රඹුක්කන.

## සාරසංක්ෂේපය

මෙම ලිපියෙන් සාකච්ඡාකර ඇත්තේ දළදා තේවාව කටයුතු වාණිජකරණයට සහ වෙනස්වීමට ලක්වී ඇති ආකාරය යි. අධ්‍යයන සොයාගැනීම් වලට අනුව තේවාව සම්බන්ධ වැඩවසම් ලක්‍ෂණ හීන වෙමින් පවතින අතර නව අංග දළදා තේවා කටයුතු සඳහා මිශ්‍ර වෙමින් පවතී. ඉඩම් භුක්ති ක්‍රමය සහ දළදා තේවාව අතර පැවති සාම්ප්‍රදායික සබඳතාව අහෝසි වී එය අරමුදල් ක්‍රමයක් බවට පරිවර්තනය වී ඇත. අනෙක් අතට පාරම්පරික උරුමයේ වෙනස්වීම් හඳුනාගත හැකි අතර දැනට තේවාවේ නිරත පුද්ගලයන්ගේ දෙවන පරම්පරාවේ සහභාගිත්වය අඩු වෙමින් පවතී. නූතනත්වය තුළ දළදා තේවාවේ වෙනස්වීම් හඳුනා ගත හැකි වූව ද කාන්තාවගේ සහභාගිත්වය සම්බන්ධ ආකල්ප තවදුරටත් අවිච්ඡින්න ව පවතී. වාණිජකරණයේ බලපෑමෙන් අතිශයෝක්ති ආගමිකත්ව ලක්ෂණ දළදා තේවා කටයුතු වලින් නිරූපණය වේ. විශේෂයෙන් ම දළදාව උදෙසා දානය සැපයීම, පූජා භාණ්ඩ පරිත්‍යාග කිරීම, වාර්ෂික පෙරහැර මංගල්‍යය සහ තේවාව කටයුතු සඳහා භික්‍ෂුණ් තෝරා ගැනීම යන අවස්ථාවන් නිරීක්‍ෂණයෙන් දළදා තේවාව ආධ්‍යාත්මික අවකාශයක් වශයෙන් පමණක් නොව වාණිජමය සහ පංතිමය අවකාශයක් වශයෙන් ද ක්‍රියාත්මක වන බව හඳුනාගත හැකි ය. විවෘත ආර්ථිකයේ සහ ගෝලීයකරණයේ ගතිකයන්ට අනුරූප ව දළදා තේවාව හා සම්බන්ධ අගයන් විශ්වාස හා ක්‍රියාකාරකම් වෙනස්වෙමින් පවතින බව මෙම අධ්‍යයනයට අනුව හඳුනාගත හැකි ය.

**කේන්ද්‍රීය වචනː** දළදා තේවාව, වාණිජ අවකාශය, ගෝලීයකරණය, සාම්ප්‍රදායිකත්වය

## හැඳින්වීම

දළදා තේවාව කටයුතු වාණිජකරණයට සහ විවිධ වෙනස්කම්වලට ලක්ව ඇති ආකාරය අධ්‍යයනය කෙරෙන මෙම ලිපිය එකී තේවාව ආධ්‍යාත්මික අවකාශයක් වශයෙන් පමණක් නොව වාණිජමය හා පංතිමය වශයෙන් ද ක්‍රියාත්මක බව පැහැදිලි කරයි.

## සාහිත්‍ය විමර්ශනය

උඩරට සමාජයේ වැඩවසම් කුල ක්‍රමය හා බැඳුණු සමාජ සංවිධාන ක්‍රමය පිළිබඳ ව සමාජ හා මානව විද්‍යාත්මක පර්යේෂණ ගණනාවක් සිදු කර ඇත (Pieris ,1956; Ryan, 1993; Yalman, 1967; සිල්වා, 1997; බණ්ඩාර, 2006). එසේ ම උඩරට සමාජයේ කේන්ද්‍රිය සාධකයක් වන දළදාව සම්බන්ධයෙන් ද ඓතිහාසික, ආගමික සහ සමාජ විද්‍යාත්මක වශයෙන් වැදගත් පර්යේෂණ ගණනාවක් මේ

වන විට සිදු කර තිබේ. දළදාව සම්බන්ධයෙන් මෙතෙක් සිදු කර ඇති සමාජ හා මානව විද්‍යාත්මක පර්යේෂණයන්හි මූලික අවධානය යොමු ව ඇති අංශ කිහිපයක් හඳුනාගත හැකි ය. සමහර අධ්‍යයන මගින් දළදා තේවාවේ අංග, වත්පිළිවෙත්වල ස්වභාවය සහ ඉතිහාසය විමර්ශනයට ලක්කොට ඇත (වජිර, 1983; රත්නපාල, 2000; සෙනවිරත්න, 2001; මහින්ද, 2006). දළදාව සම්බන්ධ ව සිදුකර ඇති අධ්‍යයන බොහොමයකින් විග්‍රහ කොට ඇත්තේ වැඩවසම් කුල ක්‍රමය හා දළදාව අතර අන්තර් සම්බන්ධතාව යි. එහි දී දළදා තේවාව හා බැඳි කුල අන්තර් සමබන්ධතාව වැඩවසම් සමාජ අවකාශයේ සංකේතාත්මක නිරූපණයක් වශයෙන් විග්‍රහ කොට ඇත (Seneviratne, 1978; සිල්වා, 1997; සුගතිමාලා, 2004). වැඩවසම් සමාජයේ පැවති කුල ධූරාවලියේ ලක්ෂණ, පසුගිය ශතවර්ෂය තුළ ශ්‍රී ලාංකික සමාජය තුළ ඇතිවූ සමාජ, ආර්ථික වෙනස්කම් හේතුවෙන් කැපී පෙනෙන විපර්යාසයන්ට ලක්විය. මෙම නූතන වෙනස්වීම් සමග දළදා තේවාවත් විපර්යාසයට ලක්වූ ආකාරය මෙතෙක් සිදුවී ඇති පර්යේෂණවලින් විග්‍රහ කිරීමට උත්සාහ ගෙන ඇත්තේ අවම වශයෙනි. එනිසා දළදා තේවාව හා සම්බන්ධ ව උඩරට සමාජයේ සිදුව ඇති තත්කාලීන වෙනස්වීම් තේරුම් ගැනීම සඳහා ඒ පිළිබඳ ව අධ්‍යයනය කිරීම වැදගත් වේ. ඒ අනුව පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලාංකේය සමාජයේ සිදුවූ සමාජ ආර්ථික වෙනස්වීම් (විශේෂයෙන් ම මෙහි දී 1977න් පසු කාලය) තුළ දළදා තේවාව වාණිජකරණයට සහ වෙනස්වීමට ලක් වී ඇත්තේ කෙසේ ද? යන අධ්‍යයන ගැටලු මෙහි දී විමර්ශනයට ලක්කොට ඇත.

## පර්යේෂණ ගැටලුව

දළදා තේවා කටයුතුවල වෙනස්වීම් කෙරෙහි වාණිජකරණයෙහි බලපෑම කෙබඳු ද යන්න මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුවයි.

## පර්යේෂණ අරමුණු

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වූයේ දළදා මාලිගාවේ තේවා කටයුතුවල දී කුලයේ වර්තමාන කාර්ය භාරය අධ්‍යයනය කිරීම සහ දළදා තේවාවන්ගේ මෑතකාලීන වෙනස්වීම් අධ්‍යයනය කිරීමයි.

## පර්යේෂණයේ වැදගත්කම

විවෘත ආර්ථිකයේ හා ගෝලීයකරණයේ ගතිකයින්ට අනුරූපව දළදා තේවාව හා සම්බන්ධ අංගයන් වෙනස්වෙමින් පවතින ආකාරය අධ්‍යයනය මගින් දළදා තේවා කටයුතු පිළිබඳ පවතින සමකාලීන තත්ත්වය අධ්‍යයනයට හැකියාව ලැබීම මේ පර්යේෂණයේ වැදගත්කමයි.

## පර්යේෂණ ක්‍රමවේදය

දළදා තේවාව ප්‍රධාන වශයෙන් කොටස් හතරක් යටතේ වර්ග කළ හැකි ය. දෛනික පූජා, සප්තාහික පූජා, විශේෂ මාසික පූජා, වාර්ෂික පූජා යනු එම වර්ග හතරයි. මෙම තේවා වර්ග හතර නියෝජනය වන පරිදි අරමුණු පදනම්වූ නියැදි

ISSN 1800-1459

ක්‍රමය (Purposive Sample) භාවිත කරමින් තේවා කටයුතුවල නිරත වූ පිරිසෙන් දත්ත දායකයින් 40ක් මෙම අධ්‍යයනයේ නියදිය වශයෙන් තෝරා ගැනුණහ. මෙම අධ්‍යයනයේ දී ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත යන දත්ත දෙවර්ගය ම භාවිත කරමින් විග්‍රහය ඉදිරිපත් කර ඇත. මෙහි දී ප්‍රාථමික දත්ත රැස්කිරීමේ දී සරල නිරීක්ෂණ ක්‍රමය, ප්‍රධාන දත්ත දායකයින් (Key Informants) මගින් තොරතුරු ලබා ගැනීම සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යන ශිල්ප ක්‍රම භාවිත කරන ලදී. ප්‍රධාන දත්ත දායකයින් වශයෙන් දළදා මාලිගාවේ කාරිය කෝරාළ, සංස්කෘතික නිලධාරිවරයා සහ තේවාවෙන් ඉවත් වූ භික්ෂූණ් වහන්සේලා යොදා ගන්නා ලදහ.

## සාකච්ඡාව

## දළදා තේවාව තුළ කුලයේ වෙනස්වීම්

බුද්ධාගම මගින් කුල ක්‍රමය හා බැඳි සමාජ අසමානතාව ය ප්‍රතික්ෂේප කළ බවට ප්‍රමාණවත් සාක්ෂි බෞද්ධ දේශනාවලින් සහ සූත්‍ර වලින් ලබාගත හැකි ය. නමුත් විමර්ශනාත්මක ව බලන විට ලාංකේය බුද්ධාගම සහ කුල ක්‍රමය අතර සම්බන්ධතාවක් පවතින බව පෙනේ. සිල්වාට අනුව (2005: 45) නූතනයේ වුව ද බුදු සමය හා කුලය අතර සම්බන්ධතාව පැහැදිලි ව දැකිය හැකි ය. සංඝ· සංස්ථාවේ ව්‍යුහාත්මක සැකැස්ම බලන විට කුලය හා සහසම්බන්ධතාවක් පිළිබිඹු කරයි. ගොවිගම කුලයට සීමාව පැවති සියම් නිකායේ උපසම්පදාව යටත්විජිත සමය තුළ වෙනස්වීමට භාජනය වූ අතර අන්‍ය කුල සඳහා ද නව නිකායන් ආරම්භ විය. නමුත් එමගින් ද සිදු වූයේ නැවත වතාවක් කුලය ආගම තුළ සංස්ථාගතවීම ය (Gombrich, 1991). අනෙක් අතට වර්තමානයේ පෙරහර පින්කම් සහ වෙනත් ආගමික පුද පූජා සාම්ප්‍රදායික කුල සේවා තවදුරටත් උපයෝගී කරගනු ලබන ප්‍රධාන සමාජ අවස්ථාවන් බවට පත්ව ඇත (සිල්වා, 2005:45-46). මහනුවර දළදා මාලිගාවේ පරිපාලනය සේවා සංවිධානය සහ වාර්ෂික ඇසළ පෙරහැර සංවිධානය වී තිබෙන්නේ කුල පදනම අනුව බව සෙනෙවිරත්න (1978) පැහැදිලි කරයි. ඉහත පර්යේෂණාත්මක අදහස් විමසා බැලීමෙන් පැහැදිලි වන්නේ බුද්ධාගම සහ කුලය අතර සම්බන්ධතාවක් පවතින බව ය. අනෙක් අතට මෙම කරුණ ස්ඵුට කිරීම සඳහා බොහෝ දෙනෙක් භාවිත කරන්නේ දළදා පෙරහර සහ තේවාවන් යන සංසිද්ධීන් ය. නමුත් නූතනයේ දළදාව හා බැඳි තේවාවන් ඇතුළු අනෙක් කාර්යයන් වලදී යම් ආකාරයක කුල වියෝජනයක් ද පවතින බව මෙම අධ්‍යයනය මගින් හඳුනාගත හැකි විය. එය අංශ කිහිපයක් ඔස්සේ හඳුනාගත හැකි ය.

වැඩවසම් සමාජය පැවති කාලයේ දළදා මාලිගාවට අයත් බස්නායක නිළමේ තනතුරට තෝරා පත්කරගනු ලැබුවේ ගොවිගම රදළ කුලයේ පුද්ගලයෙකි. නමුත් වර්තමානයේ දී දක්නට ලැබෙන්නේ උඩරට වැදගත් රදළ නොවන සාමාන්‍ය පවුල්වල සාමාජිකයින් ද එම තනතුරු සඳහා තෝරා ගන්නා ආකාරයකි. නූතනයේ තේවා කරුවන් තේරීමේ දී වඩා සැළකිලිමත් වන සාධකය වන්නේ කුලයට වඩා අදාළ තේවා ලාභියා ධාර්මික ජීවිතයක් ගත කරන්නේ ද යන්නයි. සම්මුඛ සාකච්ඡාවල දී අනාවරණය වූ පරිදි එක් අවස්ථාවකදී දළදා තේවාව හා සම්බන්ධ ගොවිගම රදළ කුලයේ ප්‍රධාන ගිහි නිලධාරියෙකු ඉවත් වූ මොහොතේ

පාරම්පරික ව ඉන් පසු තේවා කටයුතු භාර ගැනීමට හිමි පුද්ගලයාගේ චරිතයේ පැවති යම් යම් අඩුපාඩු, හැසිරීම් රටාවේ දුර්වලතා නිසා දියවඩන නිලමේගේ කැමැත්ත අනුව එම ධුරය සඳහා ගොවිගම අවශේෂ කුලයක පුද්ගලයෙකු තෝරාගෙන ඇත.

සාම්ප්‍රදායික ව දළදා මාලිගාවේ තේවාව සහ පරිපාලනය සම්බන්ධයෙන් අධිකාරීමය බලයක් සියම් නිකාය විසින් ගොඩනගාගෙන තිබේ. අන්තෝනියෝ ග්‍රාම්සිට (Antonio Gramsci) අනුව මෙම ආධිපත්‍යය සංස්කෘතිකමය හෙජමනියකි (Cultural Hegemony) (Lears, 1985). එනම් විවිධත්වයෙන් යුතු සමාජයක් තුළ එක් පංතියක් පමණක් සමාජය පාලනය කිරීමට හා ආධිපත්‍යය පැතිරීමේ තත්ත්වයකි. ලාංකේය සංඝ සමාජය සියම් නිකාය, අමරපුර නිකාය සහ රාමඤ්ඤ නිකාය වශයෙන් ප්‍රධාන නිකාය පාර්ශව තුනකට සහ ඒවාට අයත් අනුනිකාය රාශියකට බෙදී කටයුතු කළ ද දළදා තේවාව කටයුතුවල සාම්ප්‍රදායික ඒකාධිකාරය හිමිව ඇත්තේ සියම් නිකායට පමණි. නමුත් වර්තමානයේ පවතින තත්ත්වය දෙස බලන විට පැහැදිලි වන්නේ සියම් නිකායික ආධිපත්‍යය අභියෝගයට ලක් වී ඇති බවයි. නූතනයේ දියවඩන නිලමේ වරයා පත්කිරීම සහ දළදා තේවාව සම්බන්ධ සියම් නිකායික ආධිපත්‍යය පිළිබඳ ව ද විවිධ අර්බුදකාරී තත්වයන් නිර්මාණයවී ඇත. දියවඩන නිලමේවරයා පත්කිරීමේ ක්‍රමවේදය වෙනස්විය යුතු බවට ජනමාධ්‍ය හරහා විවිධ මතවාද ඉදිරිපත්වන ආකාරය දක්නට ලැබේ. දේශපාලනඥයින්ගේ සහ වෙනත් භික්ෂූණ්ගේ මතවාදය වන්නේ සියලු ම නිකායික භික්ෂූණ්ට දළදා වහන්සේ සම්බන්ධ ව ක්‍රියා කිරීමට සම අවස්ථා ලැබිය යුතු බවයි. මෙවැනි මතවාද නිර්මාණය වීමෙන් පෙනී යන්නේ දළදා වහන්සේ හා සම්බන්ධ සාම්ප්‍රදායික ක්‍රියාකාරකම්වලට අභියෝග එල්ලවන ආකාරය යි.

ගෝලීයකරණය සහ වාණිජකරණය වැනි සාර්ව සමාජයීය සංසිද්ධීන් පදනම් කරගෙන වර්තමානයේ ආරෝපිත තත්ත්වය අතික්‍රමණය කරමින් සාධිත තත්ත්වය හරහා පුද්ගලයින්ට සමාජ චලනතාව (උඩුකුරු සමාජ චලනතාව) ළඟා කරගැනීමේ ඉහළ අවකාශයක් පවතී. දළදා තේවාවට සම්බන්ධ පුද්ගලයන්ගේ පවුල් පසුබිම දෙස බලන විට ද එම තත්ත්වය පැහැදිලි වේ. උදාහරණයක් ලෙස දැක්වුවහොත් දළදා මාලිගාවේ පරිපාලනය හා සම්බන්ධ නිළධාරියෙකුගේ දරුවෙක් මේ වනවිට ඉංජිනේරුවරයෙකු වශයෙන් සුදු කරපටි රැකියාවක නිරත ව සිටියි. එම නිසා පියාගෙන් පසු ඔහුට දළදා තේවා කටයුතු සමඟ සම්බන්ධ වීමට හැකියාවක් නොමැත. එවැනි අවස්ථාවලදී විකල්ප විසඳුම් වශයෙන් අදාළ කුලයේ වෙනත් පුද්ගලයකු ඒ සඳහා සම්බන්ධ කර ගැනීමට උත්සාහ ගැනෙයි. එසේත් නැතිනම් වෙනත් කුලයක වුව ද නිලධාරීන් සෑහීමකට පත්වන පුද්ගලයෙකු තෝරා ගැනෙයි. මේ නිසා දළදා තේවාව හා බැඳි කුල පරම්පරා විසංයෝජනයක් ද නූතනයේ දැකිය හැකි ය.

උඩරට රාජධානිය නායක්කාර් වංශිකයින් පාලනය කළ සමයේ නානුමුර මංගල්‍යය පැවැත්වෙන දිනයේ නාගසිංහම් වාදනය සඳහා සහභාගී කරගත්තේ දකුණු ඉන්දීය පුද්ගලයන් ය. කෙසේ නමුත් යටත්විජිතකරණයත් සමඟ එම තත්වය වෙනස්වීමට ලක්ව ඇත. වර්තමානයේ නාගසිංහම් වාදනය සිදු කරන්නේ ද හේවිසි මණ්ඩපයට අයත් සාමාජිකයින් බව සරළ නිරීක්ෂණක දී වුව ද දැකගත හැකි ය.

වාර්ෂික ඇසළ මංගල්‍යය නිරීක්ෂණය කිරීමෙන් ද විද්‍යමාන වන්නේ කුලය හා බැඳි උඩරට සමාජ සංවිධානයේ වෙනස්වීම යි. වර්තමානයේ පෙරහැර සඳහා නැටුම් කණ්ඩායම් තෝරාගැනීමේ දී කුලය හෝ කුල කාර්යභාරය පිළිබඳ සැළකිලිමත් වන්නේ නැත. සාම්ප්‍රදායික සමාජයේ පැවති පෙරහැර සඳහා නැටුම් කණ්ඩායම් බෙරවා කුලයෙන් තෝරාගත්තේ බෙරවා කුලයට හිමි වෘත්තිය පන්සල් පෙරහර ආදියෙහි බෙරගැසීම සහ බලියාග පැවැත්වීම වූ නිසාය (Ryan, 1993; සිල්වා, 2005:29). නූතනයේ මේ සඳහා වෘත්තීමය වශයෙන් පුහුණුක් ලත් ද්විතියික අංශවල දායකත්වය ලබා ගැනීම දැකිය හැකිවේ. වර්තමානයේ දී පෙරහැර නර්තන සඳහා බහුල වශයෙන් හලාගිරිය, තෙන්නකෝන් යන නැටුම් කණ්ඩායම් ද චන්ද්‍රසේන බෞද්ධ විද්‍යාලයේ සහ ගම්පොල ජිනරතන විද්‍යාලයේ නැටුම් කණ්ඩායම් යොදා ගැනේ. විශේෂයෙන් ම පෙරහැර සඳහා නවාංග එකතුවීමත් සමඟ ද කුල ක්‍රමය අනවශ්‍ය සාධකයක් බවට පත්වෙමින් පවතී (පෙරහැර සඳහා එක්වූ නවාංග පසුවට විස්තර කෙරේ).

කෙසේ වෙතත් ඉහතින් පැහැදිලි කළ කරුණු අනුව නූතනයේ දළදා තේවාවන් වලදී කුලය අදාළ නොවේ යැයි නිගමනය කළ නො හැකි ය. එසේ වුවහොත් එය අධි සරළ නිගමනයකි. නමුත් සාම්ප්‍රදායික ව පැවති කුලය හා සම්බන්ධ වූ දෘඪ ආධිපත්‍ය කෙමෙන් ගිලිහීයන බව දැකිය හැකි ය. ඒ අනුව සමාජ නවීකරණයත් සමග කඩාවැටෙන සාම්ප්‍රදායික වටිනාකම් කුල පැවැත්ම අභියෝගයට ලක් කොට ඇත.

## වාණිජ සමාජ සන්දර්භය තුළ දළදා තේවාව

විවෘත ආර්ථිකය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස වාණිජකරණයේ බලපෑම් ආගමික, දේශපාලන, සමාජ සහ ආර්ථික ක්ෂේත්‍රයන් කෙරෙහි යොමුවිය. කෘත්‍යවාදී ආගමික විග්‍රහයේදී ඓන්ද්‍රීය සදෘශ්‍ය සංකල්පය මගින් හර්බට් ස්පෙන්සර් විග්‍රහ කරන්නේ සෑම සමාජ ව්‍යුහයන් අතර ම අන්තර් සබඳතා හා අන්තර් යැපීම් පවතින බවය (කරුණාතිලක, 1991:49). මේ නිසා එක් සමාජ සංස්ථාවකට සිදුවන බලපෑම් තවත් සමාජයක් සඳහා බලපෑම් කරන්නේ සමාජ සංස්ථා අතර පවතින අන්තර් යැපීම් සම්බන්ධතා නිසාවෙනි. මාක්ස් වාදී විග්‍රහය අනුව මෙම කාරණය විමසන්නේ නම් උපරි ව්‍යුහයේ හැසිරීම අධෝව්‍යුහය මත වෙනස්වීමක් වශයෙන් විශ්ලේෂණය කළ හැකි ය.

පසුගිය දශකයන් තුළ ආර්ථික සංස්ථාවේ සිදු වූ විපර්යාසයන් ආගමික සංස්ථාව කෙරෙහි බලපෑම් කර ඇති ආකාරය දළදා තේවාව වාණිජකරණයට ලක්වී තිබීමෙන් පැහැදිළි වේ. දළදා මාලිගාවේ පැවති රත්නමාලී යන්ත්‍රය (සංසාර සාරෝස විනීත නීසං..) මේ වනවිට වෙළඳ භාණ්ඩයක් බවට පත්වී ඇත්තේ වාණිජකරණයේ ප්‍රතිඵල වශයෙනි. වැඩසිටින මාලිගාව තුළ සිදුවන තේවා කටයුතු රහසිගත ව සිදු කළ නමුත් එහි පවතින දේවල් නූතනය වන විට වාණිජකරණයට ලක් වී ඇති ආකාරය පැහැදිලි වේ. වෙළඳ ආයතන විසින් එය ආකෘතියක් ලෙසින් භාවිත කරන නිසා දළදා කරඬුව සහිත රත්නමාලී යන්ත්‍රය විවිධ ස්වරූපයන්ගෙන් නිර්මාණය කර පාරිභෝගික භාණ්ඩයක් බවට පත්ව තිබෙන අයුරු නිරීක්ෂණය කළ හැක. අනෙක් අතට රත්නමාලා ගාථා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමඟ රූපවාහිනී, ගුවන්විදුලි මාධ්‍ය හරහා නිතර ප්‍රචාරය වන ආකාරය දක්නට

ISSN 1800-1459

ලැබේ. දළදා තේවාවල දී හේවිසි මණ්ඩපයේ දක්නට ලැබෙන ශබ්ද පූජාවල දී පවත්වනු ලබන හේවිසි වාදනය තේමා කරගෙන මේ වනවිට විවිධ ගීත නිර්මාණය වී තිබෙන අයුරු දැකිය හැකි ය. විශේෂයෙන් ම දළදා හේවිසි වාදනය පසුබිම් සංගීතය ලෙසින් භාවිත කර විරහ ගීත නිර්මාණය වී තිබෙන ආකාරය හඳුනාගත හැකි ය. එපමණක් නොව දූරකථන නාද රටා සඳහා ද දළදා තේවා වලදී භාවිත කරන හේවිසි වාදනය යොදා තිබෙන ආකාරය නූතන සමාජ සන්දර්භය මගින් නිරීක්ෂණය කිරීමේ හැකියාව පවතී.

වාණිජ්‍යකරණය දළදා තේවාවට කෙතරම් බලපෑමක් සිදුකර ඇත්දැයි පැහැදිලි වන එක් නිදර්ශනයක් මෙහි දී ඉදිරිපත් කිරීම මෙම ක්‍රියාවලිය තේරුම් ගැනීම සඳහා පහසු වන්නකි. සම්ප්‍රදාය අනුව දළදා තේවාව දිනකට තුන්වරක් පවත්වනු ලැබේ. එනම් අළුයම් දුරය (අළුයම 5.30-7.30), නවපැය දුරය (දහවල් 10.30-11.30) සහ හැන්දෑ දුරය (සවස 6.30-8.30) වශයෙනි. වැඩ සිටින මාලයට ප්‍රවිශ්ට වන්නේ මෙම අවස්ථාවන් හි දී පමණි. නමුත් නූතනයේ සංචාරක ව්‍යාපාරයේ වර්ධනයත් සමග ඇතැම් අවස්ථාවන් හි අවේලාවන් තුළ වුව ද වැඩසිටින මාලිගයට සංචාරකයින්ට ප්‍රවිශ්ට වීමට අවකාශය ලබා දේ. විශේෂයෙන් ම සඳහන් කළ යුතු කරුණක් වන්නේ දළදා තේවාව කරනු ලබන භික්ෂුවට තේවාවෙන් ලැබෙන වරප්‍රසාද හේතුවෙන් දළදා තේවාව ලබා ගැනීම සඳහා පවතින තරඟයයි. සම්මුඛ සාකච්ඡාවක දී තේවාවෙන් විශ්‍රාමගත් එක් භික්ෂුවක් දැක් වූ අදහස් පහත දැක්වේ.

> "... සම්ප්‍රදාය අනුව තේවාවෙ අයිතිය පැවරෙන්නේ අස්ගිරියට. සහ මල්වත්තට. ඒවගෙත් පරම්පරාවන් තියෙනවා. උදාහරණ වශයෙන් අස්ගිරියෙ, යටපන්සල් පරම්පරාව, මැද පන්සල් පරම්පරාව සහ පොතුහැර පරම්පරාව වශයෙන් පරම්පරාවල් තියෙනවා. අස්ගිරියට තේවාව ආවට පස්සෙ මේ පරම්පරාවන්ට මාරුවෙන් මාරුවට යනවා. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කාලයට පෙර දළදා තේවාව කියන්නේ හරිම දුෂ්කර ක්‍රියාවක්. මාලිගාවට ඈත ඉඳන් එන්න ඕනෑ. පාන්දරින් එන්න ඕනෑ. රෑවෙලා යන්න වෙන්නෙ. හුළු අතු අරන් ආවේ. ආවත් ඉන්න තැනක් නෑ. දානෙ වළඳන්න තැනක් නෑ. තේවාව භාරගත්තන් පස්සෙ අම්මා මැරුණත් යන්න බෑ. ඒ කාලෙ තේවාවට භික්ෂුවක් හොයාගන්න එකත් අමාරු වැඩක්, දැන් එහෙම නෑ. තේවාවෙන් හොඳ ආදායමක් ලැබෙනවා. ද්‍රව්‍යමය සහ මූල්‍ය වටිනාකම වශයෙන්. දැන් තේවාව ගන්න පුදුම තරඟයක් තියෙන්නේ. තේවාව හින්දා පන්සල්වල ලොකු ලොකු සිද්ධි පවා වෙනවා. අමනාපකම් කෙලවරක් නෑ. තේවාව කරන කෙනා යමක් ගත්තත් ප්‍රශ්නයක් නෑ. නමුත් අද එතන තියෙන්නෙ ලොකු මාර්කටිං එකක්. සමහර දවස්වලට ආදායම ලක්සෙ පනිනවා. පිරිවෙන්වල පත්වීම් කරන හාමුදුරුවරු ඒක අතෑරලා තේවාව ගන්න එනවා. තේවාවෙන් ලැබෙන වරප්‍රසාද හින්දම ඒකට තියෙන සද්භාවය අඩුවෙලා,." (සම්මුඛ සාකච්ඡා දත්ත)

## ඉඩම් භුක්තියේ සිදුව ඇති පරිවර්තනයන්

උණුවතුර බුබුලේ මහින්ද (2006) දක්වන ආකාරයට වර්තමානයේ දළදා තේවා කටයුතු සිදු වන්නේ අරමුදල් මාර්ගයෙනි. ඉඩම් භුක්ති ක්‍රමය අහෝසි වී ඇත.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 155-174
ISSN 1800-1459

සම්මුඛ සාකච්ඡාවලින් ලැබුණු තොරතුරු සහ නිරීක්ෂණයේ දී අනාවරණය වූ ආකාරයට දළදා තේවාවන් සඳහා සහභාගී වන කාර්යය මණ්ඩලයට මුදල් ගෙවීමක් සිදුවේ. පවතින සමාජ, ආර්ථික සන්දර්භය යටතේ නින්දගම්වලින් පමණක් ලැබෙන ආදායම තේවාකරුවන්ගේ ආර්ථික අවශ්‍යතා සපුරා ගැනීමට කිසිසේත් ප්‍රමාණවත් නොවේ. ඉඩම් භුක්තියෙන් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවීම නිසා ඇතැම් තේවා කරුවන් දළදා තේවාවන් සඳහා සම්බන්ධ නොවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙන අතර ඒ හේතුවෙන් ඉඩම් භුක්ති ක්‍රමය අරමුදල් ක්‍රමයක් දක්වා පරිවර්තනය කිරීමට සිදු වී ඇත. මේ අනුව නූතනයේ දළදා තේවාව සමඟ සම්බන්ධ සියලු කාර්යය මණ්ඩලයට දළදා මාලිගාවෙන් මාසික ව ගෙවීමක් සිදුවේ. ඇතැම් තේවා කරුවන්ට දෛනික ව මුදල් ගෙවීම් සිදු වන ආකාරය සරළ නිරීක්ෂණයේ දී දැකගත හැකි විය. උදාහරණයක් වශයෙන් සඳහන් කළහොත් දළදා මාලිගාවේ කවිකාර මඩුවේ සාමාජිකයින්ට නානුමුර මංගල්‍යයට සහභාගිවී එම තේවා කටයුතු අවසන් වූ වහාම දළදා මාලිගාවේ මුදල් අංශයෙන් නියමිත මුදල් ගෙවීම් සිදු වේ. මෙම මූල්‍යමය ගෙවීම් සඳහා අවශ්‍ය මුදල් රජයෙන්, පරිත්‍යාගශීලීන්ගෙන් සහ දළදා මාලිගාව සතු ඉඩකඩම්වල ආදායමින් ලබා ගැනේ.

නින්දගම් හරහා ලැබෙන ආදායම පවුලේ කෘත්‍යයන් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් නොවීම නිසා ද ඉඩම් භුක්ති ක්‍රමය අහෝසි වී ඇත. දළදා මාලිගාවේ කටයුතු වලට සහ වැඩවසම් පරිපාලන ක්‍රමයට සම්බන්ධ වූ පුද්ගලයන්ට ලබා දුන් රාජකීය ඉඩම් නින්දගම් යනුවෙන් හැඳින්වේ. නින්දගම් නිලයට අයත් ප්‍රසාදයන් වශයෙන් ලබාදුණි (පීරිස්,1964:60). මෙම ඉඩම් භුක්ති ක්‍රම සාම්ප්‍රදායික ව ඉහත කී කෘත්‍යයන් ක්‍රමානුකූල ව පවත්වාගෙන යාම සඳහා උපකාරී වුවත් නූතනයේ එවැනි ඉඩම් භුක්තියක් දැකිය හැක්කේ නාමිකව ය. වරින්වර සිදු වූ සමාජ ආර්ථික පරිවර්තනයන් හමුවේ සමාජ අන්තර් ක්‍රියාවන් මුදල මුල්කරගත් ක්‍රමයක් බවට පත්ව ඇත. වාණිජවාදී සමාජ ක්‍රමය තුළ සාම්ප්‍රදායික ඉඩම් භුක්තිය මගින් තව දුරටත් සේවාවන් ලබා ගත නොහැකි වී තිබේ. ඒ නිසා නින්දගම් ඉඩම් භුක්තියේ විශාල පරිවර්තනයක් සිදු ව තිබේ. ඇතැම් තේවාකරුවන් දළදා මාලිගාවෙන් ලබා දී තිබූ නින්දගම් වෙනත් පුද්ගලයන්ට බදු දීම සිදු කොට ඇති බව සම්මුඛ සාකච්ඡාවලින් ලැබුණු තොරතුරුවලින් පැහැදිලි විය. මෙම නින්දගම් විකුණා මුදල් ලබාගැනීමේ අවස්ථාවන් ද ඇති බව පැහැදිලි විය. මෙම හේතු නිසා දළදා තේවාව වෙනුවෙන් මූල්‍යමය ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය විය.

දළදා තේවාවට සම්බන්ධ සාමාජිකයින් වෙනත් වෘත්තීන්හි නිරතවන අයුරු දක්නට ලැබේ. විවෘත ආර්ථිකයත් පරිභෝජනවාදයත් සමඟ මුදල සඳහා විශාල වටිනාකමක් හිමි වූ අතර තරඟකාරී සමාජ ක්‍රමයක් නිර්මාණය විය. පුද්ගල වටිනාකම් භාණ්ඩකරණයට ලක් වී ඇත. මේ නිසා දළදා තේවාවට සම්බන්ධ පුද්ගලයන් ද ඉඩම් භුක්තියෙන් ලැබෙන ආදායම මත පමණක් යැපීමට උත්සාහ දරන්නේ නැත. විවිධ විකල්ප ආර්ථික ක්‍රියාකාරකම්වලට යොමු වීම සිදුවිය. දළදා මාලිගාවේ කවිකාර මඩුවේ සාමාජිකයින් නානුමුර මංගල්‍යය සඳහා පමණක් සහභාගී වන අතර සතියේ සෙසු දිනවල දී මහනුවර නගර සභාවේ රැකියා සහ මහනුවරින් පිටත රැකියා සිදුකිරීම දක්නට ලැබේ. තේවා කටයුතු සඳහා පමණක් සහභාගී වී ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවන නිසා වෙනත්

වෘත්තීන් කරා යොමු වන තත්වයක් පැවතීමෙන් පෙනීයන්නේ ඉඩම් භුක්ති ක්‍රමය පවතින සමාජ, ආර්ථික රටාවට සමපාත නොවන බවයි.

මේ අනුව වෙනස් වන සමාජ, ආර්ථික ක්‍රමයට අනුව දළදා මාළිගාවේ තේවා කටයුතු සහ ඉඩම් භුක්තිය අතර පැවති සබඳතාව ය ප්‍රතිසංවිධානයට ලක්ව ඇති ආකාරය හඳුනාගත හැකි ය.

## පාරම්පරික උරුමයේ වෙනස්වීම්

ශ්‍රී ලාංකේය සමාජ, ආර්ථික, දේශපාලන ක්ෂේත්‍රයන්හි වෙනස්වීම් ඇතිවීමට විවෘත ආර්ථිකය හඳුන්වා දීමෙන් පසු ඇතිවූ වාණිජකරණ ක්‍රියාවලිය සෘජුව ම හේතු විය. අනෙක් අතට දේශපාලන වශයෙන් ඇති වූ විපර්යාසයන් තුළ ද භික්ෂුවගේ පරමාදර්ශී භූමිකාවේ වෙනස්වීම්වල සිට සමස්ත ආගමික සංස්ථාව ම ලෞකිකකරණයක් දක්වා පරිවර්තනය විය (Seneviratne, 1999). ආගමික ක්ෂේත්‍රයේ සිදු වූ මෙවැනි විපර්යාස දළදා තේවාව වෙනුවෙන් ද බලපෑම් කළේ ය. දළදා තේවාව සඳහා සම්බන්ධ වූ සුවිශේෂ පරම්පරා කිහිපයක් වැඩවසම් සමාජයේ දක්නට ලැබුණු අතර නූතනයේ එම තත්වය ක්‍රමයෙන් වියැකී යන ආකාරයක් දැක ගන්නට ලැබේ. මේ වන විට දළදා මාලිගාවේ නැකැත් මොහොට්ටාල වශයෙන් කටයුතු කරන්නේ ද විශ්‍රාම ගිය නොතාරිස්වරයෙකි. ඒ අනුව පාරම්පරික උරුමයක්ව පැවති නැකැත් මොහොට්ටාල ධුරය වෙනස්වන සමාජ, ආර්ථික ප්‍රවාහයට හසු වූ ගතික ධුරයක් බවට පත්වී ඇත.

දළදා මාලිගාවේ කවිකාර මඩුව දළදා තේවාවන් සමඟ සම්බන්ධ වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ සිට ය. ඒ අනුව වැඩවසම් සමාජයේ සිට ම ඇරැප්පල කැළෑ කෝරළේ ගෙදර පරම්පරාවේ සාමාජිකයන් කවිකාර මඩුවට සම්බන්ධ විය. කවිකාර මඩුවට සම්බන්ධ වීමේ දී එකම පරම්පරාවේ පුද්ගලයන් මෙන් ම එකම ප්‍රදේශයේ පුද්ගලයන් වීම අනිවාර්ය සුදුසුකමක් ලෙසින් පැවතිණි. වැඩවසම් සමාජයේ දී දළදා තේවාවට සම්බන්ධ වූයේ උඩරට ප්‍රදේශයට අයත් පුද්ගලයින් ය. වර්තමානයේ මෙම සාම්ප්‍රදායික ක්‍රමයන්ගේ වෙනස්වීම් හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම කවිකාර මඩුවෙන් මේ තත්ත්වය අවබෝධ කර ගත හැකි ය. මේ වනවිට කවිකාර මඩුවට සම්බන්ධ වී සිටින එක් පුද්ගලයෙක් අනුරාධපුර ප්‍රදේශයට අයත් ය. එමෙන් ම ඔහු සම්බන්ධ වී ඇත්තේ මව් පාර්ශවය නියෝජනය කරමින් ය. නමුත් වැඩවසම් සමාජයේ කවිකාර මඩුවට සම්බන්ධ වූයේ පියපේරු ක්‍රමයට ය. කවිකාර මඩුවේ සාමාජිකයකු මිය ගිය පසු ඔහුගේ පිරිමි දරුවන් ඊට සම්බන්ධ වී නොමැත. මෙසේ දෙවන පරම්පරාව දළදා තේවා කටයුතු සඳහා සම්බන්ධ වීමට පැවති අකමැත්ත හේතුවෙන් වෙනත් ප්‍රදේශයක වෙනත් පරම්පරාවක පුද්ගලයෙක් නූතනයේ කවිකාර මඩුවට සම්බන්ධ වී සිටින අයුරු දක්නට ලැබේ. සමාජ වෙනස්වීමත් සමඟ කඩා වැටෙන වටිනාකම් ආගම තුළ නිරූපණය වන බවට පශ්චාත්නූතනවාදීන් විග්‍රහ කරන්නේ මේ නිසාවෙනි (දෝෂි, 2008).

දළදා තේවා කටයුතු සඳහා ආලත්ති අම්මාවරු සම්බන්ධ වූයේ මහනුවර තලවත්තේ පරම්පරාවෙන් ය. මෙහිදී බොහෝවිට මව් පාර්ශවයෙන් තේවාව සඳහා අවස්ථාව හිමිවී ඇත. නමුත් නූතනයේ දක්නට ලැබෙන්නේ තලවත්තේ

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 155-174
ISSN 1800-1459

පරම්පරාවට අයත් පුරුෂයන් සමඟ විවාහ වන කාන්තාවන් ද ආලත්ති අම්මාවරුන් ලෙස ක්‍රියාකරන ආකාරයකි.

වර්තමානයේ තේවා කටයුතුවල නිරත පුද්ගලයන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා වලින් පැහැදිලි වූ පරිදි දළදා තේවා කටයුතු සඳහා සම්බන්ධ වීමට දැනට තේවාවේ නිරත පුද්ගලයන්ගේ දෙවන පරම්පරාව රුචිකත්වයක් නොදක්වයි. උසස් අධ්‍යාපනය හරහා සුදු කරපටි රැකියා වෙත යොමු වී උඩුකුරු සමාජ චලනතාව ලබාගැනීම ඔවුන්ගේ අපේක්ෂාවයි. දළදා තේවා කටයුතු සඳහා සම්බන්ධ වීමෙන් ලැබෙන වැටුප ප්‍රමාණවත් නොවීමත් වැඩවසම් සමාජයේ නෂ්ටාවශේෂ වශයෙන් ලේබල් වීමටත් ඇති අකමැත්ත නිසාවෙනුත් නූතන පරම්පරාව තේවාවට සම්බන්ධ වීමට රුචිකත්වයක් නොදක්වයි. විශේෂයෙන් ම දළදා තේවාවල දී හේවිසි මණ්ඩපයේ සිට ශබ්ද පූජා පවත්වන සාමාජිකයින්ට වෙනත් විහාරස්ථානයක සිය වෘත්තියෙහි නියැලීම සඳහා අවස්ථාව හිමි නොවේ. එම හේතු නිසා දෙවන පරම්පරාවේ සහභාගීත්වය අවිනිශ්චිත බව ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී අනාවරණය විය.

වැඩවසම් සමාජයේ දළදා මාලිගාවට අයත් ගම් දහය වන කිතුල්පේ, මුංවතුගොඩ, කලුගොමුව, පිලිගල්ල, අලපලාවල, රදාගොඩ, ඒදඬුවාව, අලදෙණිය, පිටිගොඩ සහ අංගොඩ යන ගම්වල සාමාජිකයින් දළදා තේවා කටයුතු සඳහා සම්බන්ධ විය (සෙනෙවිරත්න, 2001:138). නමුත් නූතනයේ මෙම ප්‍රදේශවලින් පිටත වෙනත් ප්‍රදේශවල පුද්ගලයින් දළදා තේවා කටයුතු සඳහා සම්බන්ධ වී සිටින ආකාරය දක්නට ලැබේ. උදාහරණයක් ලෙස නූතනයේ ඇසළ පෙරහැර පැවැත්වීමේ දී පෙරහැර කරඬුව රැගෙන යන ඇතා ඇතුළු සියලු ම ඇතුන් සඳහා ඇඳුම් නිර්මාණය කරන්නේ හින්දු ආගමික පුද්ගලයෙකි. දළදා මාලිගාව මොහුට ගෙවීම් සිදු කරයි. මේ අනුව සාම්ප්‍රදායික ක්‍රම වෙනස් වී මුදල මූලික වී ඇති අයුරු දක්නට ලැබේ.

දළදා තේවාවේ දී අවශ්‍ය බුද්ධ පූජාව සැකසීම සඳහා වැඩවසම් යුගයේ දී දළදා මාලිගාවට වළං සපයන ලද්දේ කුඹල් කුලයේ පුද්ගලයින් ය. නමුත් වර්තමානයේ දක්නට ලැබෙන්නේ විදුලි උපකරණ භාවිත කරන ආකාරයයි. මේවා විවෘත ආර්ථිකයෙන් පසු ශ්‍රී ලංකාවට ආනයනය කළ විදේශීය භාණ්ඩයෝය. මේ අනුව වාණිජකරණ ක්‍රියාවලිය පාරම්පරික උරුමයන්, පාරම්පරික සම්ප්‍රදායන් වෙනස්කිරීමට සෘජුව ම දායක වී ඇති ආකාරය පැහැදිලි වේ.

## තේවාකරුවන්ගේ සංයුතිය සහ ධූරාවලියේ වෙනස්වීම්

දළදා මාලිගාවේ තේවා කටයුතු සිදු කරන කාර්ය මණ්ඩලය ඇතුල් කට්ටලේ සහ පිට කට්ටලේ වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර වාණිජ්‍යකරණයේ බලපෑමත් සමඟ මෙම සංයුතියේ විවිධ වෙනස්වීම් සිදුව තිබීම හඳුනාගත හැකිය. වැඩවසම් සමාජයේ පැවති නිලතල බොහොමයක් ඉවත් වී ඇති අතර නව නිලතල කිහිපයක් එකතු වී ඇත (දසනායක, 1994:31). දළදා තේවා කටයුතු සඳහා සම්බන්ධ වන ඇතුල් කට්ටලේ සහ පිට කට්ටලේ අධ්‍යයනය කිරීමෙන් ද මේ බව තහවුරු වේ.

වර්තමානයේ දළදා තේවා කටයුතු සඳහා සම්බන්ධ කාරිය කෝරාළ ධූරය වෙනුවට සාම්ප්‍රදායික වැඩවසම් සමාජයේ පැවතියේ කංකානම් පදවියයි. නමුත් නූතනයේ එය අහෝසි වී ඇත. එමෙන් ම පල්ලෙමාලෙ රාළ ධූරය දළදා තේවා කටයුතු සමඟ සම්බන්ධ වන්නේ ද මෑත කාලීනව ය. රාජාණ්ඩු පාලනය පැවති කාලයේ මෙම ධූරය නොපැවති බව සම්මුඛ සාකච්ඡා වලදී පැහැදිලි විය. වැඩවසම් සමාජයේ දළදා තේවාව සඳහා ආරච්චිළ ලෙස හඳුන්වන පුද්ගලයින් කිහිප දෙනෙකු සම්බන්ධ වී සිටිය ද නූතනයේ තේවා සඳහා සිටින පුද්ගල සංයුතියේ දක්නට ලැබෙන්නේ දොරකඩ ආරච්චි ධූරය පමණි. ඉඩම් භුක්ති ක්‍රමය පැවති යුගයේ තේවාවට සම්බන්ධ වූ සෑම පුද්ගලයෙකු සඳහා ම නින්දගම් ලබාදීම සිදු විය. නූතනයේ තේවාවට සම්බන්ධ සෑම නිලධාරියෙකුට ම මූල්‍යමය ගෙවීම් සිදුකළ යුතු වීම නිසා පිරිවැය අඩුකිරීමේ අවශ්‍යතාව නිසා ද සංයුතියේ වෙනස්වීම් ඇතිකිරීමට හේතු වී තිබේ.

දළදා තේවා සිදු කරන කාර්යය මණ්ඩලයේ නූතනයේ දක්නට ලැබෙන්නේ එක් කත් තියන රාළ කෙනෙක් පමණි. නමුත් මීට පෙර දශකවල කත් තියන රාළලා දෙදෙනෙක් දළදා තේවා කටයුතු සමඟ සම්බන්ධ වී සිටි බව සම්මුඛ සාකච්ඡා වලදී පැහැදිලි විය. දළදා මාලිගාවේ තේවාවන් සිදු කරන සංයුතිය තුළ තේවා කාරක භික්ෂූන්ගේ වර්ධනය වීමක් දක්නට ලැබේ. දළදා තේවාවේ ප්‍රසාරණය කාර්යය මණ්ඩලයේ ප්‍රසාරණයට හේතු වී ඇත. විශේෂයෙන් ම වැඩවසම් යුගයේ දළදා තේවා කටයුතු සඳහා සම්බන්ධ වූයේ භික්ෂූණ් තිදෙනෙක් පමණි. නමුත් වර්තමානයේ දළදා තේවා කටයුතු සඳහා භික්ෂූණ් පස් දෙනෙකු සම්බන්ධ වී සිටිති.

දළදා තේවා කටයුතු සඳහා නවාංග එකතුවීම මෙන් ම තේවා කටයුතු සිදු කරන කාර්ය මණ්ඩලයේ අඩු වැඩි වීමක් හඳුනාගත හැකි ය. නූතනයේ දළදා මාලිගාවේ මුළුතැන්ගේ රාජකාරි සඳහා හයදෙනෙක් සම්බන්ධ වී සිටිති. කෙසේ නමුත් වැඩවසම් සමාජ ක්‍රමය පවතින විට මුළුතැන්ගේ රාජකාරි සඳහා පුද්ගලයන් දෙදෙනෙකු පමණක් කටයුතු කළ බව සම්මුඛ සාකච්ඡා වලදී පහැදිලි විය. වැඩවසම් සමාජයේ දී දළදා පූජා සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නින්දගම් හිමි පුද්ගලයන් විසින් ලබා දෙන ලදී. නමුත් වර්තමානයේ දක්නට ලැබෙන්නේ දෛනික තේවා කටයුතු සඳහා බැතිමතුන් විසින් දායකත්වය දරනු ලබන ආකාරයකි. මෙහිදී තේවාවන් සඳහා බැතිමතුන් ලබාදෙන පූජා ද්‍රව්‍ය මුළුතැන්ගේ මගින් භාර ගැනීම සිදුවේ. මේ නිසා පූජා ද්‍රව්‍ය භාර ගැනීමේ දී වැඩි සාමාජිකයන් පිරිසකගේ දායකත්වය අවශ්‍ය වන්නේ පූජා ද්‍රව්‍ය මැනවින් පරීක්ෂා කිරීම අවශ්‍ය නිසාවෙනි. නූතනයේ මුළුතැන්ගේ තුළ දක්නට ලැබෙන්නේ විවෘත ආර්ථිකයෙන් පසු හඳුන්වා දෙනු ලැබූ විවිධ ස්වරූපයේ විදුලි උපකරණයන් ය. මේවා නිවැරදි ව හැසිරවීමේ දක්ෂතා සහිත පුද්ගලයින් මුළුතැන්ගේ රාජකාරි සඳහා සම්බන්ධ කර ගැනීම සිදුවේ. බුද්ධ පූජාව වෙලාවට නිසි පරිදි සැකසීම අවශ්‍ය නිසාත් ඒ සඳහා වැඩි පිරිසක් සහභාගි කර ගැනීම සිදුවේ. මේ අනුව බලන කල පැහැදිලි වන්නේ බුද්ධ පූජාව සකසන්නාගේ සිට දියවඩන නිලමෙවරයා දක්වා සිටින සංයුතියේ විවිධ විපර්යාසයන් සිදුවී ඇති ආකාරයයි.

## වෙළඳ අවකාශයේ පූජා භාණ්ඩ

නූතනයේ දක්නට ලැබෙන ප්‍රවණතාව වන්නේ පින් බලාපොරොත්තුවෙන් පූජා කරන භාණ්ඩ විවෘත ආර්ථිකයේ ඍජු නිෂ්පාදනයන් වීමයි (පෙරේරා, 1997: 122). මේ අනුව විවෘත ආර්ථික ප්‍රතිපත්ති මගින් ඇති වූ පරිභෝජනවාදය ආගමික ජීවිතයට අන්තර්ගත වී ඇති ආකාරය පැහැදිලි වේ.

දළදා මාලිගාවට බැතිමතුන් විසින් පූජා කරනු ලබන පූජා භාණ්ඩ ලෙස රත්‍රන් මාල, රන් රිදී කරඬු, විදුලි පංකා, විවිධ වර්ගයේ විදුලි බල්බ, අටපිරිකර, මුලුතැන්ගේ සඳහා අවශ්‍ය විදුලි උපකරණ, ඇන්කර්, හෝර්ලික්ස් ඇතුළු විවිධ කිරිපිටි වර්ග පෙන්වා දීමට පුළුවන. මෙම පූජා භාණ්ඩ නිරීක්ෂණය කරන විට පෙනී යන්නේ ඒවා බොහොමයක් විවෘත ආර්ථිකයේ ඍජු නිෂ්පාදනයන් බවයි. මෙම පූජා භාණ්ඩ බොහොමයක් මිල අධික ය. වාණිජ්‍යකරණ ක්‍රියාවලිය ආගමික සංස්ථාවට බලපෑම් කරන ආකාරය මෙහිදී පැහැදිලි වේ. සාම්ප්‍රදායික සමාජයේ මිනිසුන් විසින් දළදා වහන්සේ වෙනුවෙන් පූජා කරනු ලැබුවේ අලුත් සහල් කිරිබත්, කෙසෙල් ඇවරි හෝ වෙනත් දේශීය නිෂ්පාදනයන් ය. වාණිජ්‍යකරණයේ බලපෑමත් සමඟ දානය වශයෙන් හෝ භාණ්ඩ වශයෙන් පූජා කරනු ලබන ද්‍රව්‍යයන්ගේ මූල්‍යමය අගය සහ සමාජමය වටිනාකම විශාල වෙනසකට භාජනය වී ඇත.

දළදා වහන්සේ වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරමින් රත්‍රන් මාල පූජා කිරීම බහුල ව සිදු වන බව සම්මුඛ සාකච්ඡාවල දී පැහැදිලි විය. නෙළුම් මල් වට්ටියක් පූජා කරනවාට වඩා රත්‍රන් මාල පූජා කිරීමෙන් වැඩි පිනක් බලාපොරොත්තුවෙන් මෙවැනි පූජා සිදු කෙරෙයි. සතියකට රත්‍රන් මාල පූජා කිරීමේ අවස්ථා අවම වශයෙන් දෙකක් පමණ වාර්තා වේ. බැතිමතුන් පූජා කරන භාණ්ඩවල අනන්‍යතාව තහවුරු කරමින් අදාළ ආයතනය විසින් ලබාදෙන රිසිට් පත දළදා මාලිගාවේ ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. එය ලේඛනගත කිරීම සිදු වේ. ඉන්පසු දළදා මාලිගාවේ ප්‍රධාන කාර්යාලයේ සිටින නියෝජිතයෙකු විසින් රිසිට් පත ලබාදුන් එම ආයතනයට දුරකථන ඇමතුම් ලබාදී එම භාණ්ඩයේ අනන්‍යතාව තහවුරු කර ගැනීමෙන් පසුව පූජා කිරීමට හැකියාව ලැබේ. කෙසේ නමුත් දළදා කරඬුවෙහි එම රත්රන් මාල පැළඳවීමට හෝ වෙනත් භාණ්ඩ එහි තැන්පත් කිරීමට හැකියාව පවතින්නේ දියවඩන නිලමේවරයාට පමණි. 1977න් පසු මෙම ක්‍රියාව ආරම්භ වී ඇත. එම භාණ්ඩ පූජා කරනු ලබන බැතිමතුන්ට මේ සඳහා අවස්ථාව හිමි නොවේ. පෙරේරා (1997) දක්වන්නේ නාගරික මධ්‍යම පාංතිකයින් සිදු කරන මහා පරිමාණ යාතු කර්මවලට පහළ පාංතික බැතිමතුන් අවකාශීය වශයෙන් දුරස්ථ ව සහභාගීවන බවයි. දළදා මාලිගාවේ මෙවැනි යාතු කර්මවල දී අනුග්‍රාහකයාට පවා දුරස්ථ අවකාශයක සිට යාතු කර්මවලට සහභාගීවීමට සිදුව ඇත්තේ ආගමික සංස්ථාවේ විනය සහ සම්ප්‍රදාය නිසා ය.

ආගම වාණිජ්‍යකරණය වීමත් සමඟ තේවා කටයුතුවල දී බුද්ධ පූජාව සඳහා යොදා ගත් භාණ්ඩයන්ගේ වෙනස්වීමක් දැකගත හැකි ය. වැඩවසම් සමාජ ක්‍රමය පැවතින කාලයේ බුද්ධ පූජාව සකසනු ලැබුවේ කුඹල් කුලයේ පුද්ගලයන් විසින් පූජාකරනු ලැබූ මැටි වලංවල ය. නමුත් විවෘත ආර්ථිකයෙන් පසු ආහාර

පිසීම සඳහා විදුලි උපකරණ (විදුලි උදුන්, බ්ලෙන්ඩර්, ගෑස් ලිප්, විදුලි කේතල්) භාවිත කිරීම සිදු වේ. මේ සඳහා මිල අධික භාණ්ඩ පූජාකර ඇතිබව දක්නට ලැබිණි. මෑත කාලයේ එක් ව්‍යාපාරිකයෙක් කෝටි 1 1/2 ක් වටිනා රන්සිවි ගෙයක් පූජා කර ඇත. පෙරේරා (1997) දක්වන ආකාරයට මෙවැනි මිළ අධික මහා පරිමාණ යාතුකර්ම කිරීමෙන් යාතුකර්ම කාරකයින් අපේක්ෂා කරන්නේ ඉක්මනින් නිවන් දැකීම හෝ අඩුම වශයෙන් මේ ආත්මයේ දී මාර්ගඵල අත්කර ගැනීම ය (පෙරේරා, 1997).

## අතිශයෝක්ති ආගමිකත්වය හා දළදා තේවාව

වෙනස්වෙමින් පවතින සමාජ, ආර්ථික, සහ දේශපාලන සංදර්භය තුළ බුදු දහමේ පවතින යාතුකර්ම අභිචාර ආදිය විපර්යාසයට ලක් වේ. පශ්චාත් නූතනවාදීන් විග්‍රහ කරන්නේ ආගමේ පවතින මෙම අභිචාර, යාතුකර්ම නිරන්තරයෙන් වෙනස්වීමට ලක්වන අතර එසේ සිදු නොවුණ හොත් එය ආගමේ දාර්ශනික ඉගැන්වීම් අසත්‍ය කරවන බවයි. ආගමේ පවතින මෙම වෙනස්වීම්වලට අනුව සමාජානුයෝජනය වන පිරිසක් ආගමෙන් ම නිර්මාණය වේ. උයන්ගොඩ (2007) දක්වන්නේ අතිශයෝක්ති ආගමිකත්වය තුළ වෙසක් උත්සවය ද සැණකෙලියක් බවට පත්ව ඇති බවයි. බටහිර සංගීතය මුසු වූ වෙසක් බැති ගී සැණකෙලියේ එක් සංකේතයකි.

වර්තමානයේ පවතින්නේ අතිශයෝක්ති ආගමිකත්වයකි. පෙරේරා (1997:109) දක්වන්නේ පින් ලබාගැනීම හා සම්බන්ධ ව පවතින බෞද්ධ මූලධර්ම වෙනස්වීම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇති බවයි. සම්මුඛ සාකච්ඡාවලින් පැහැදිලි වූ ආකාරයට දළදා තේවා කටයුතුවල දී ද මෙම ආගමික අතිශයෝක්තිය පිළිබිඹු වේ. විශේෂයෙන් ම නූතනයේ දළදාව සඳහා කෙරෙන තේවා කටයුතු සඳහා දායකත්වය දැරීමේ දී අධික මුදලක් වියදම් කිරීමට සිදුවේ. සාම්ප්‍රදායික ව පූජා ද්‍රව්‍ය ගැමියා සිය අවට පරිසරයෙන් සකසා ගත්ත ද නූතනයේ එය වෙළෙඳපොළ භාණ්ඩ ලැයිස්තුවක් බවට පත්ව ඇත. අනෙක් අතට එය සාමාන්‍ය ආදායම් ලබන්නෙකුට නම් කිසිසේත් ඉටු කළ නොහැකි මහා පරිමාණ යාතු කර්මයකි.

දළදා මාලිගාවේ පැවැත්වෙන නව පැය බුද්ධ පූජාව මේ සඳහා කදිම නිදසුනක් ලෙසින් පෙන්වා දිය හැකි ය. සම්මුඛ සාකච්ඡාවලට සහ නිරීක්ෂණයන්ට අනුව නව පැය බුද්ධ පූජාව සඳහා වැඩි වශයෙන් දායකත්වය දරනු ලබන්නේ සුදු කරපටි පාංතිකයන් ය. විශේෂයෙන් ම මෙම නව පැය බුද්ධ පූජාව වෙනුවෙන් දායකත්වය දැරීමේ දී රුපියල් විසිපන්දහසකට අධික මුදලක් වැයකිරීමට සිදුවන බව එයට දායක වූ කොළඹ ප්‍රදේශයේ බැතිමතුන් කණ්ඩායමක් ප්‍රකාශ කළහ. මෙම පුණ්‍ය කර්මයට සහභාගි වන්නන්ගේ අරමුණ වන්නේ වැඩි මුදලක් වියදම් කර පුණ්‍ය කර්මයන් සිදු කිරීම මඟින් ඉක්මනින් සසර කෙළවර කරගෙන නිර්වාණය සාක්ෂාත් කර ගැනීමයි. කෙසේ නමුත් මෙම නව පැය බුද්ධ පූජාව සඳහා අධික මුදලක් වැය වුව ද දායකත්වය ලබා ගැනීම සඳහා ඉහළ පාංතික බැතිමතුන් අතර ඇත්තේ තරඟයකි.

ISSN 1800-1459

**වගු අංක 01 : ශ්‍රී දළදා මාලිගාවේ අමුතු මුල්තැන් බුද්ධ පූජාව සඳහා අවශ්‍ය පූජා ද්‍රව්‍ය සහ ප්‍රමාණය**

| පූජා ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|
| කැකුළු හාල් | සේරු 05 |
| තම්බාපු හාල් | සේරු 32 |
| එලවළු (වර්ග 32) | ග්‍රෑම් 100 බැගින් |
| පොල් | ගෙඩි 15 |
| පොල්තෙල් | බෝතල් 04 |
| පැණි | බෝතල් 03 |
| ලුණු | සේරු 1/2 |
| කහකුඩු | ග්‍රෑම් 200 |
| මිරිස් | ග්‍රෑම් 500 |
| රතු ලූණු | ග්‍රෑම් 500 |
| සුදු ලූණු | ග්‍රෑම් 200 |
| කොත්තමල්ලි කුඩු | ග්‍රෑම් 200 |
| සූදුරු | ග්‍රෑම් 100 |
| උලු හාල් | ග්‍රෑම් 100 |
| අබ | ග්‍රෑම් 50 |
| ගම්මිරිස් | ග්‍රෑම් 100 |
| සව්හාල් | ග්‍රෑම් 50 |
| මාගරින් | ග්‍රෑම් 100 |
| විම් | පොඩි ටින් 01 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2010

**වගුව අංක 02 : ශ්‍රී දළදා මාලිගාවේ අමුතු මුලුතැන් පූජාවේ අතුරු පස සැකසීමට ගන්නා පූජා ද්‍රව්‍ය සහ ප්‍රමාණය**

| පූජා ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|
| මී පැණි | බෝතල් 1/4 |
| උක් පැණි | බෝතල් 1/4 |
| සීනි | කිලෝ 02 |
| සූකිරි | ග්‍රෑම් 750 |
| අමු ඉඟුරු | ග්‍රෑම් 250 |
| මුද්දරප්පලම් (අමු/වියළි) | ග්‍රෑම් 300 |
| ඉඟුරු දෝසි | ග්‍රෑම් 500 |
| හකුරු | ලොකු මුල් 01 |
| පැණි දොඩම් | ගෙඩි 06 |
| අඹ | ගෙඩි 06 |
| අන්නාසි | ගෙඩි 06 |
| ඇල් තෙලිජ්ජ | බෝතල් 01ක් බෝතල් 1/ 2 සිඳ |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2010

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013. සත්වැනි කලාපය. පිටු 155-174
ISSN 1800-1459

දෛනික ව සිදු වන නව පැය බුද්ධ පූජාව සඳහා බෙහෝ දුරට දායක වන්නේ කොළඹ, මහනුවර, මාතලේ, කුරුණෑගල සහ කෑගල්ල ප්‍රදේශවල නාගරික ඉහළ පාංතික බැතිමතුන් ය. මෙම තේවාවන් සඳහා දායකත්වය දරන පවුල්වල වෛද්‍යවරු, ඉංජිනේරුවරු, ව්‍යාපාරිකයින්, ගණකාධිකාරිවරු, කළමණාකාර අධ්‍යක්ෂවරු, නීතිඥයන් අනිවාර්යෙන් සිටින බව සම්මුඛ සාකච්ඡාවලදී පැහැදිලි විය. සාමාන්‍ය පවුල්වල බැතිමතුන් මෙම තේවා කටයුතු සඳහා දායකත්වය දැරීම සිදු නොවන බව සරල නිරීක්ෂණයේ දී වුව ද දක්නට ලැබේ. විශේෂයෙන් ම දෛනික තේවා කටයුතු සඳහා අධික මුදලක් වැය වීම එයට හේතුවයි. පෙරේරා (1997:121) දක්වන්නේ ද අතිශයෝක්ති ආගමිත්වය වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ මධ්‍යම පාන්තිකයන් සහ ව්‍යාපාරික ස්තර තුළ බවයි.

සාම්ප්‍රදායික සමාජයේ මෙම නව පැය තේවාවට දායක වූයේ නින්දගම් හිමි පුද්ගලයන් ය. නමුත් ඉඩම් භුක්ති ක්‍රමය අහෝසි වීමත් සමඟ මෙම තත්ත්වය වෙනස් වූ අතර මූල්‍ය සම්පත් සහ කාලයේ අතිරික්තයක් පවතින බැතිමත්හු බොහෝ විට මෙහි දායකත්වය දරති. මුදලින් වැඩි කොටසක් මෙවැනි යාතුකර්ම සඳහා වෙන් කරමින් මානසික වශයෙන් පවතින අර්බුදකාරී තත්වයනගෙන් එනම් ආතති කළමණාකරණය කර ගැනීම අපේක්ෂා කෙරේ. ආර්ථික වශයෙන් ශක්තිමත් වූ මෙම පිරිස් ආධ්‍යාත්මික වශයෙන් ශක්තිමත් වීම සඳහා විශාල වශයෙන් මුදල් වියදම් කර මහා පරිමාණ යාතුකර්ම කිරීම සඳහා පෙළඹේ. තර්ස්ටන් වෙබ්ලන් (Thorstein Veblen) ඔහුගේ "The Theory of Lessure Class" කෘතියෙන් විග්‍රහ කරන්නේ නූතන මිනිසා නිර්ලෝභී ව විවේකය ගත කිරීම සඳහා විවේකය අර්ථවත් කරන ක්‍රියා කාරකම් සංවිධානය කරන බවයි. ඔහුට අනුව එය විදේශ සංචාරයක්, වන්දනාගමනක්, ඔරු පැදීමක් භෝජන සංග්‍රහයක්, හෝ දඩයමේ යෑමක් වුව ද විය හැකි ය. මධ්‍යම පාන්තිකයන් අතර බහුල ව දක්නට ලැබෙන මෙවැනි ක්‍රියාකාරකම් මගින් ඔවුන්ගේ විවේකය අර්ථවත් කරන ක්‍රියාකාරකම් මගින් අන්‍යයන්ගෙන් වෙන් කොට පෙන්වීමටත්, සමාජ බලය සහ සමාජ තත්වය පෙන්වීමත් අපේක්ෂා කෙරේ. විශේෂයෙන් ම වෙබ්ලන් දක්වන ආකාරයට වියපැහැදම්වලදී නිර්ලෝභීවීම සමූහ වශයෙන් සැමරීම සහ ආශ්වාදය උපරිමණය කරගැනීමට හැකිවීම යන ලක්ෂණයන් මෙවැනි විවෙක ක්‍රියාකාරකම්වල දී පොදුවේ දැකිය හැකි බවයි (Veblen, 1899).

දළදා මාලිගාවේ නවපැය බුද්ධ පූජාව (අමුතු මුල්තැන් පූජාව) තුළ ද මහා පරිමාණ යාතුකර්මීය ලක්ෂණ පවතින බව පෙනී යයි. මේ සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවීම, දළදා මාලිගාව වැනි ලෝක ප්‍රසිද්ධ ස්ථානයක එය සංවිධානය කිරීම යන කරුණු නිසා මහා පරිමාණ ආගමික යාතුකර්මීය ලක්ෂණ අන්තර්ගත ව පවතින බව පෙන්වා දිය හැකි ය. අනෙක් අතට විදෙස් රටවල සිට පැමිණෙන සිය ඥාති හිතවතුන් සම්බන්ධකර ගනිමින් විවේකය අර්ථවත් ව ගතකිරීම, ව්‍යාපාර සාර්ථක කර ගැනිම සහ අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීම වැනි ලෞකික අපේක්ෂාවන් වෙනුවෙන් භාරහාර ඔප්පු කිරීම මෙවැනි වත්පිළිවෙත් සංවිධානය කරන්නන්ගේ අරමුණු වී ඇත. තවත් සැළකිය යුතු පිරික් ආධ්‍යාත්මික සුවය සඳහා ද මෙවැනි දායකත්වයන් දරන බව සම්මුඛ සාකච්ඡාවල දී පැහැදිලි විය. මතුපිටින් පෙනෙන අරමුණු මේවා වුව ද අතිශයෝක්ති ආගමිකත්වය විසින් හැඩගස්වන් ලද ලෞකික අපේක්ෂාවන් මේ මගින් දිස්වෙන බව පැහැදිලි වේ. කෘත්‍යවාදී ව බලන්නේ නම් මෙවැනි යාතුකර්ම සඳහා දායකවීමෙන්

මානසික තෘප්තිය ලබාගැනීමට හැකියාව ලැබේ. විශේෂයෙන් ම දළදා තේවාව මනෝ ප්‍රතිකාර ක්‍රමයක් ලෙසින් හඳුන්වන්නේ ඒ නිසාවෙන් ය. සමස්තයක් වශයෙන් බලන විට දළදා තේවා සඳහා අනුග්‍රාහක දායකත්වය දරන්නේ ඉහළ පන්තිය නියෝජනය කරන, සුදු කරපටි රැකියාවල නිරතවන සමාජ හා සංස්කෘතික ප්‍රාග්ධනය වර්ධනය කරගත් සමාජයේ ඉහළ යැයි සැලකෙන පිරිස් ය.

## නූතනත්වය තුළ පෙරහැර තේවාව

වාර්ෂික ව පැවැත්වෙන දළදා තේවා වර්ග අතරින් ඇසළ පෙරහැර ප්‍රධාන ස්ථානයක් හිමිවේ. දෙස් විදෙස් සංචාරකයෝ විශාල ප්‍රමාණයක් දළදා පෙරහැර නැරඹීම අරමුණු කරගෙන මහනුවර නගරයට පැමිණෙති. ඒ අනුව වර්තමානයේ දළදා මාලිගය හා දළදා පෙරහර ක්‍රියාකාරකම් සංචාරක අවකාශයක් වශයෙන් ද හඳුනාගත හැකි ය. නූතන දළදා පෙරහැර අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වන්නේ එය ආගමික උත්සවයකට වඩා විනෝදාස්වාදය ලබාදෙන සැණකෙළියක් බවට පත්ව ඇති ආකාරයකි. ශ්‍රී පාදය වන්දනාව චූල සම්ප්‍රදායේ අවශ්‍යක වන්දනා ගමනක් වශයෙන් ගණනාත් ඔබේසේකර හැඳින් වුව ද නූතනයේ එය විනෝදාශ්වාදය ලබා දෙන චාරිකාවක් බවට ද පත්ව ඇත (Silva, 2007:136). බුදු තෙමඟුල සිහිපත් කරන වෙසක් උත්සවය ද සැණකෙළියක් බවට පත්ව ඇත (Uyangoda, 2007). මේ අනුව පැහැදිලි වන්නේ බුදු දහම හා සම්බන්ධ බොහෝ අංග වෙනස්වීමට ලක්වී ඇති ආකාරයකි.

දළදා වහන්සේ වෙනුවෙන් කරනු ලබන පුද සත්කාරයක් ලෙස දීර්ඝ ඉතිහාසයක් පුරා පැවති දළදා පෙරහැර මගින් සාම්ප්‍රදායික සමාජයේ පැවති වැඩවසම් සමාජ ක්‍රමය සහ සමාජ ස්ථරායනය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට හැකියාව ලැබුණ ද නූතන දළදා පෙරහැර මගින් එම සාධකයන් ග්‍රහණය කරගැනීම අසීරු ය. එය නිරීක්ෂණය කිරීමෙන් අවබෝධ කරගත හැකි ය. එය වෙනස්වන සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ප්‍රවාහයට නතු වූ ලාංකික ප්‍රපංචයක් බවට පත්වී ඇත.

ඓතිහාසික කවර අංගයක් වුව ද වර්තමානයට පැමිණීමේ දී විවිධ වෙනස්කම් වලට භාජනය වීම නො වැළැක්විය හැකි කරුණකි. ආගමේ පවතින විවිධ අංගයන් ද සමාජ, ආර්ථික, දේශපාලන විපර්යාස අනුව පරිවර්තනයකට ලක්වීම සිදුවේ. පශ්චාත් නූතනවාදීන් විග්‍රහ කරන්නේ ආගමේ පවතින අභිචාර යාතුකර්ම යනාදිය විසංයෝජනයට ලක්වීම නිරන්තරයෙන් සිදුවන බවයි (පතිරණ, 2005). දළදා පෙරහැරේ සිදුවී ඇති විසංයෝජනයන් නිසා එහි ඓතිහාසික වටිනාකම නිරූපණය නොවේ.

මහනුවර රාජධානි සමයේ දී දළදා පෙරහැර පවත්වා ඇත්තේ දෙවියන් සම්බන්ධ, දෙවියන්ට ගෞරව කිරීමක් වශයෙන් සිදු කරන උත්සවයක් ලෙසින්ය (බණ්ඩාර, 2006:845). නූතනයේ මෙන් දළදා මාලිගාවේ සහ දේවාලවල වශයෙන් වෙන් වෙන්ව නොව එකම පෙරහැරක් ලෙස එදා පෙරහැර සංවිධානය වී පැවතිණි. සම්මුඛ සාකච්ඡාවලින් පැහැදිලි වූ පරිදි වර්තමාන දළදා පෙරහැර 75% ක් පමණ දක්නට ලැබෙන්නේ නවාංගයන් ය. සාම්ප්‍රදායික ලක්ෂණ දළදා පෙරහැර තුළ

අන්තර්ගත ව පවතින්නේ 25% ක් පමණ ය. සම්මුඛ සාකච්ඡාවේදී කාරිය කෝරාළ පැවසුවේ,

> "රජ කාලෙ තිබ්බ ඒවා ගොඩක් අඩුයි. සුද්දන්ගේ පාලන කාලෙන් පස්සෙ තමයි මේවා වෙනස් වුණේ. දැන් පෙරහැර 75% ක් විතරම වෙනස්වෙලා තියෙන්නේ. පෙරහැර බලනකොට ඔයාලටත් තේරෙනවනේ අළුත් ඒවා ගොඩක් එකතු වෙලා තියෙනවා" (සම්මුඛ සාකච්ඡා දත්ත).

මහනුවර දළදා පෙරහැරට වර්තමානයේ දී නවාංග රැසක් එකතුවී ඇති බව මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන අතර එහි ආරම්භය යටත්විජිතකරණ සමය වේ. නූතන දළදා පෙරහැරට විශේෂයෙන් එකතු වූ නවාංගයක් ලෙස පෙරහැර ආරම්භයේ දී ගමන් කරන පොලිස් මෝටර් රථය පෙන්වා දිය හැකි ය. මීට අමතර ව පොලිස් යතුරු පැදි සහ පොලිස් නිලධාරීන් දක්නට ලැබේ. සාම්ප්‍රදායික සමාජයේ පෙරහැර පැමිණෙන බව නරඹන්නන්ට සන්නිවේදනය කළේ කසකරුවන් විසිනි. නමුත් මේ වනවිට කසකරුවන් සම්ප්‍රදායේ නාමික සංකේතයක් බවට පත්වී ඇත. තාක්ෂණයේ දියුණුවත් සමඟ වර්තමානයේ එම තත්වය නිර්මාණය වී තිබේ. පශ්චාත් නූතනවාදීන් විග්‍රහ කරන්නේ නූතන සමාජයේ ප්‍රධාන වාහකයා වන්නේ තාක්ෂණය බවයි (දෝෂි, 2008:26). මේ අනුව තාක්ෂණය ආගමික සංස්ථාව කෙරෙහි බලපෑම් කරන ආකාරය පැහැදිලි වේ. තාක්ෂණයේ බලපෑම නිසා පෙරහැර සන්නිවේදනය කරන සාම්ප්‍රදායික ක්‍රම වෙනස්වී තිබේ.

නූතනයේ දළදා පෙරහැර වීථි සංචාරය කරන අතරතුර කාසි ඇහිදීමේ සම්ප්‍රදාය දක්නට ලැබේ. මෙහිදී නරඹන්නන් විසින් කසකරුවන්, වෙස් නැටුම් කණ්ඩායම්, ගිනිබෝල කරුවන් (වල්පොල ගිනි කෙළි) පෙරහැරේ ගමන් කරන විට මඟ දෙපස සිට කාසි විසි කිරීම දක්නට ලැබේ. දළදා පෙරහැරේ දක්නට ලැබෙන නවාංගයක් වන මෙය බැතිමත්හු භාරහාර ඔප්පු කිරීමක් වශයෙන් සිදු කරති. වාණිජකරණයත් සමඟ භාරහාර ඔප්පු කිරීමේ ක්‍රම වෙනස් වීමට ලක්වී ඇති ආකාරය මෙහිදී අවබෝධ කරගැනීමට හැකි වේ. මහනුවර ඇසළ මංගල්‍යය බෞද්ධ පෙරහැරක් බව සංකේතවත් කරමින් බෞද්ධ කොඩි රැගෙන යාම සිදුවේ. සාම්ප්‍රදායික සමාජයේ මෙම කොඩි රැගෙන යනු ලැබුවේ එම ප්‍රදේශ භාර නිලධාරීන් විසින් ය. නමුත් නූතනයේ බෞද්ධ කොඩි රැගෙන යාම සිදු වන්නේ බෝගම්බර බන්ධනාගාරයේ රැඳවියන් විසිනි. එය කිසිදු අර්ථයකින් සිදු වන්නක් නොවේ. නූතන ඇසළ පෙරහැර මංගල්‍යයේ දී පන්දම් රැගෙන යාම සිදු කරනු ලබන්නේ හන්තාන ප්‍රදේශයේ වතු දෙමළ ජනතාව විසින් ය. රාජාණ්ඩු පාලනය පැවති කාලයේ රජු විසින් මේ සඳහා වෙනම පිරිස් පත්කර තිබුණි. බොහෝ දුරට ඒ සඳහා ගම් දහයට අයත් ප්‍රදේශ වල පුද්ගලයින් සහභාගී විය.

දළදා පෙරහැරේ පෙරමුණේ රාළ ගමන් කරන අවස්ථාව වැදගත් අංගයකි. සාම්ප්‍රදායික සමාජයේ දී පෙරමුණේ රාළ විසින් රැගෙන යනු ලැබුවේ රජු විසින් පෙරහැර පැවැත්වීම සඳහා ලබාදෙන ලද අවසර පත්‍රයකි. නමුත් නූතනයේ රැගෙන යන්නේ ලේකම් මිටිය නමින් හඳුන්වනු ලබන පුස්කොළ පොතක් බව සම්මුඛ සාකච්ඡාවල දී අනාවරණය විය. පුරාණ දළදා පෙරහැරේ මහබඹාගේ පිළිරුව ගෙනයාම වැදගත් අංගයක් ලෙස සාම්ප්‍රදායික සමාජයේ පැවති ඇසළ

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 155-174
ISSN 1800-1459

පෙරහැරේ නිරූපණය කර ඇත. නමුත් යටතවිජිතකරණයෙන් පසු එම අංගය පෙරහැරෙහි නිරූපණය නොවූණු බව සම්මුඛ සාකච්ඡාවල දී අනාවරණය විය. එසේම දළදා පෙරහැරේ ගිනි කෙළි කණ්ඩායම නරඹන්නන්ගේ දැඩි අවධානයට ලක්වූ අංගයකි. කෙසේ නමුත් ගිනි කෙළි සංදර්ශන පවත්වන්නේ කිසියම් මුදලක් නියම කරගැනීමෙන් පසුව ය. පෙරහැර ආරම්භ කිරීමට පෙර පෙරහැර කාර්යාලය සමඟ සාකච්ඡා කිරීමෙන් ගිනි කෙළි සංදර්ශන වෙනුවෙන් ලැබිය යුතු මුදල පිළිබඳ තීරණය කර ගැනීම සිදු වේ.

වර්තමාන ඇසළ පෙරහැරෙහි ප්‍රධාන අංගයක් ලෙසින් වෙස් නැටුම් කණ්ඩායම හඳුන්වා දිය හැකි අතර එය දළදා පෙරහැරට එක් වූයේ පශ්චාත් යටත්විජිත සමයේ ය. මීට අමතර ව දළදා පෙරහැරට එක්වූ නවාංග ලෙස කලගෙඩි නැටුම, කාවඩි නැටුම, පන්තේරු නැටුම්, ලී කෙළි, උඩුක්කි, සවරං නැටුම, චාමර නැටුම සහ රබන් නැටුම් හඳුන්වා දිය හැකි ය. බොරු කකුල් කණ්ඩායම් කිහිපයක් දළදා පෙරහැරේ අන්තර්ගතව පවතින අතර මේවා මෑතකාලීනව දළදා පෙරහැරට එක්වූ නවාංගයන් ය. දළදා පෙරහැරට නවාංග එක්වීමෙන් සිදු වී ඇත්තේ එහි ආගමික වටිනාකම බිඳ වැටී සංන්දර්ශනාත්මක වටිනාකම් ආදේශවීම යි.

ඇසළ පෙරහැරට නූතනය වන විට නවාංග රැසක් එක්වී ඇති අයුරු දක්නට ලැබේ. ආශිර්වාද නැටුමක් වන බුලත් පදය නූතනයේ ඇසළ පෙරහැරට එක්වූ නවාංගයක් වන අතර නිලංග දැල දියවඩන නිලමේවරයා විසින් එය දළදා පෙරහැරට එක් කරන ලද්දේ 2010 වර්ෂයේ ඇසළ පෙරහැර වෙනුවෙන් ය. මීට අමතර ව කොතල පදය, වේවැල් නැටුම, පොල්මල් නැටුම සහ පතුරු කණ්ඩායම ද මෙම දියවඩන නිලමෙවරයා විසින් ඇසළ මංගල්‍යය වෙනුවෙන් එක්කරන ලද නවාංගයන් ය. පතුරු කණ්ඩායමේ විශේෂත්වය වන්නේ පෘතුගීසි සංස්කෘතියේ සහ සිංහල සංස්කෘතියේ මිශ්‍රණයකින් නිර්මාණය වී තිබීමයි. යටත්විජිත යුගයේ පැවති සංස්කෘතික ලක්‍ෂණ තවමත් ඉතිරිව පවතින බව මෙහිදී පැහැදිලි වේ. කඩුව සහ පලිහ යොදා ගනිමින් සිදු කරන කඩු නැටුම ද දළදා පෙරහැරට එක් වූ නවාංගයකි. කඩු නැටුම සාම්ප්‍රදායික පෙරහැරෙහි අන්තර්ගතව පැවතිය ද කඩුව හා පලිහ දළදා පෙරහැරට එක්වූයේ නූතනයේ දී ය.

දළදා පෙරහැර අවසන් වන්නේ දිය කැපීමේ චාරිත්‍රය පැවැත්වීමෙන් පසුව ය. එය ගැටඹේ දියකපනා තොටේ දී සිදු කරයි. මෙහිදී සතර දේවාලයන්හි කපු රාළවරු සිව් දෙනා සමඟ ආවතේවකරුවන් සිව් දෙනෙක් සරසන ලද ඔරුවක නැගී මහවැලි ගඟ මධ්‍යයට ගමන් කරති. මෙහිදී කඩු සහ රන් කෙණ්ඩි රැගෙන සිව්දෙනා විසින් කඩුවෙන් දිය දෙපසට වෙන් කිරීම සිදු කරනු ලබයි. ඉන් පසු පසුගිය වර්ෂයේ පුරවාගත් පැන් ඉවත්කර කඩුව දියෙහි ස්පර්ශවන ස්ථානයේ ඇති ජලය කෙණ්ඩියට පුරවා ගැනීම සිදු වේ. සාම්ප්‍රදායික සමාජයේ දිය කැපීමේ මංගල්‍යය මෙසේ සිදු වුවත් නූතනයේ යම් වෙනස්වීම් හඳුනාගත හැකි ය. නූතනයේ දී දිය කැපීමේ චාරිත්‍රය සඳහා ඔරුවලින් ගමන්කර ගඟ මධ්‍යයට යාම සිදු නොවන බව සම්මුඛ සාකච්ඡාවලදී පැහැදිලි විය. එම කාර්යය නිසි පරිදි සිදුකළ හැකි පුද්ගලයන් නොසිටීම නිසා කපුරාළලා දණහිස තෙමෙන තෙක් දියට බැස දේවාභරණ ජලයේ ස්පර්ශ කර එම ස්ථානවලින් රන් කෙණ්ඩි වලට ජලය පුරවා ගැනීම සිදු කරති.

දළදා පෙරහැරට නවාංග එක්වීම සහ විවිධ විපර්යාසයන් සිදුවීම පශ්චාත් යටත්විජිත යුගයේ දී දැකිය හැකි ප්‍රවණතාවකි. මෙහිදී සාම්ප්‍රදායික අනන්‍යතාව කෙරෙහි සැළකිලිමත් වීමක් දක්නට නොලැබේ. ඩෙරිඩා පශ්චාත් නූතනවාදී ආගමික විග්‍රහය මගින් පැහැදිලි කරන්නේ සමාජය වෙනස්වීමට ලක්වීමේ දී කඩාවැටෙන වටිනාකම් දක්නට ලැබෙන බවයි (පතිරණ, 2005:186). නූතනයේ දළදා පෙරහැර ඇසළ සැණකෙළියක් බවට පත්වී තිබීම මගින් ඒ බව තහවුරු වේ.

## නිගමනය

රස්ටි ලින්ඩික්ස්ට් (Rusty Lindquist, 2008) දක්වන්නේ ආගම වාණිජකරණයට භාජනය වීමෙන් පසු ආගමේ හර පද්ධතිය ද වාණිජ අපේක්ෂාවන් විසින් හැඩගස්වන බවයි. පශ්චාත් නූතනවාදී සමාජ සන්දර්භය තුළ දී විග්‍රහ කරන්නේ ද ආගමේ දාර්ශනික පැතිකඩ වෙනස් නොවුව ද, අභිචාර, යාතුකර්ම ආදී ආගමේ ප්‍රායෝගික පැතිකඩ වෙනස් වීමට ලක්වන  බවයි (පතිරණ, 2005). මේ තත්ත්වය තුළ දළදා තේවා කටයුතු ද වෙනස්වීමට ලක් වී ඇති ආකාරය හඳුනාගත හැකි ය. සාම්ප්‍රදායික වැඩවසම් සමාජයේ පැවති අංග වෙනස් වී ඇති අතර නවාංග එකතු වෙමින් පවතී. දළදා තේවා කටයුතු සිදු කරන කාර්යය මණ්ඩලයේ අඩු වැඩි වීම හඳුනා ගත හැකි අතර ආර්ථිකය තාක්ෂණය වැනි හේතු ඒ සඳහා බලපා ඇත. දළදා තේවාව සහ ඉඩම් භුක්ති ක්‍රමය අතර පැවති සබඳතාව ය අරමුදල් ක්‍රමයක් දක්වා පරිවර්තනය වී ඇත. දළදා තේවාව හා සම්බන්ධ ව පැවති පාරම්පරික උරුමයේ වෙනස්වීම් සිදු වී ඇති බව හඳුනාගත හැකි ය.

නූතන දළදා තේවාවන් වැඩවසම් සමාජ අවකාශය ප්‍රතිනිර්මාණය කිරීමක් පමණක් නොව වාණිජ අන්තර් ක්‍රියාවක් ද වන බව පෙරහැර මංගල්‍යය අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. ගෝලීයකරණයේ සහ නාගරීකරණයේ බලපෑමත් සමග මුදල සමාජයේ අනිවාර්ය සාධකය බවට පත්වීමත් සමග මෙම තත්වයේ විපර්යාසයන් සිදු විය. නූතන දළදා පෙරහැර ගැඹුරින් විශ්ලේෂණය කරන විට ඒ මගින් කුල ස්තරායනය පිළිබඳ අවබෝධයක් ලබාගත නො හැකි අතර එය ඇසළ මාසයේ පැවැත්වෙන සැණකෙළියක් බවට පත් වී ඇති ආකාරය නිගමනය කළ හැකි ය. දළදා පෙරහැර තුළ නියෝජනය කරන සියලු පාර්ශවයන් සඳහා මුදල් ගෙවීමක් සිදුවන අතර වාණිජ අවකාශය එමගින් නිරූපණය වේ.

දළදා තේවාව මගින් වැඩවසම් සමාජ අවකාශය සංකේතාත්මක ව ප්‍රතිනිර්මාණය කිරීමට උත්සාහ ගෙන ඇත. නමුත් ඇතැම් අවස්ථාවල දී මූලාකෘතියේ වැදගත්කම ගිලිහී යන ආකාරය දක්නට ලැබේ. අතීතයේ මෙන් ම වර්තමානයේ දී ද තේවා කටයුතු බෞද්ධාගමික සන්දර්භයක් තුළ සිදු වුව ද බෞද්ධ සංජානනයේ සිදුවන වෙනස්වීම් මත දළදා තේවා කටයුතු වල වෙනස් වීම් සිදු වී තිබේ. මේ අනුව හුදු සංකේතාත්මක අන්තර්ක්‍රියාවක් ලෙස දළදා තේවාව අවබෝධ කර ගැනීමට උත්සාහ කළ ද, නූතනයේ එය වැඩවසම් සමාජ අන්තර්ක්‍රියාවක් පමණක් නොවන බව පැහදිලි වේ. දළදා තේවාව වාණිජ අවකාශයක් වශයෙන් ද හඳුනා ගත හැකි ය.

*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 155-174*
*ISSN 1800-1459*

## පරිශීලිත මූලාශ්‍රය

කරුණාතිලක, කේ. (1991) *සමාජ විද්‍යා න්‍යාය,* කඩවත, මාලිංග ප්‍රකාශකයෝ

දසනායක, ඇම්. බී. (1994) *කන්ද උඩරට ඇසළ පෙරහැර,* කොළඹ, සමයවර්ධන ප්‍රකාශන

දෝෂි, එච්. එල්. (2008) *පශ්චාත්නූතනවාදය යනු කුමක්ද?,* ප්‍රවාද, වෙළුම 6 (ජනවාරි- ජූනි), 05-45

පතිරණ, මහින්ද (2005) *පශ්චාත්නූතනවාදය, වළ සහ විල,* කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ

පරිස්, රැල්ෆ් (1964) *සිංහල සමාජ සංවිධානයඃ* මහනුවර යුගය, පෙරේරා, කේ. ඒ. ඩී. (පරි), බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශකයෝ.

පෙරේරා, සසංක (1997) *"ව්‍යවහාරික බුද්ධියේ වියෝගයඃ ශ්‍රී ලාංකික සමාජයේ සමාජයීය, සංස්කෘතිකමය හා දේශපාලනික ප්‍රවණතාවන් කිහිපයක් පිළිබඳ අදහස් දැක්වීමක්",* කොළඹ, ජනවාර්ගික අධ්‍යයනයන් සඳහා වූ අන්තර් ජාතික කේන්ද්‍රය

බණ්ඩාර, ගුණරත්න, එම්. වී. (2006) *"දළදා පෙරහැරෙන් නිරූපණය වන සමාජ ස්තරායනය හා එහි නූතන වෙනස්වීම්" සම්භාෂා,* 14 වන කලාපය (නොවැ. දෙසැ.)ඃ 830-859

මහින්ද, උණුවතුරබුබුලේ (2006) *"දළදා වහන්සේ සම්බන්ධ පුද සිරිත්",* ගාමිණී රත්න ශ්‍රී විසින් සංස්කරණය කරන ලද *ප්‍රමාණාමාඤ්ජලී,* මහනුවර, ලාභී සමූහ ව්‍යාපාරය

රත්නපාල, ඊ. ඇම්. (2000) *දළදාව හා සමාජය, පන්නිපිටිය,* ස්ටැම්ෆර්ඩ් ලේක් ප්‍රකාශන

වජිර, කඹුරුගමුවේ (1983) *දළදා ඉතිහාසය හා සංස්කෘතිය,* කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ

සිල්වා, කාලිංග ටියුඩර් (2005) *කුලය පන්තිය සහ ලංකාවේ සමාජ ගැටුම්,* බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශකයෝ

______ (1997) *කුලය පන්තිය සහ වෙනස්වන ලංකා සමාජය,* මහනුවර, ප්‍රජා අධ්‍යයන කවය

සුගතිමාලා, සමීනා (2004) *"ධූරාවලිය සහ සමානාත්මතාවය",* රමණී ජයතිලක විසින් සංස්කරණය කරන ලද *සමාජ විද්‍යා සිංහල පරිවර්තන.* කොළඹ, විභාෂා පරිවර්තන වැඩ සටහන

සෙනෙවිරත්න, අනුරාධ (2001) *සිරි දළදා වරුණ,* කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ

සෙනෙවිරත්න, එච්. එල්. (2001) *"බුද්ධාගම සංඝයා සහ සිවිල් සමාජය",* ප්‍රවාද, 17 කලාපය (ජන-මාර්තු)ඃ 37-46

ISSN 1800-1459

Gombrich, Richard and Gananath Obeyesekere. (1988) *Buddhism Transformed; Religious Change in Sri Lanka.* Princeton : Princeton University Press.

Gombrich, R. (1991) *Precept and Practice: Traditional Buddhism in Rural Highlands of Ceylon.*Delhi, Motilal

Lears, T.J.J. (1985) "The Concept of Cultural Hegemony: Problems and Possibilities" In, *The American Historical Review*, Volume 90, Issue 3 (June.,1985), PP.567-593.

Lindquist, Rusty. (2008) *Commercialization of religion.* Available: http:// mormonconversations.com/the-commertiolization-of-religion.Accessed on: 25/10/2010.

Ryan, Bryce (1993) *Caste in Modern Ceylon. New Delhi,* Navrang ( First published in 1957)

Seneviratne, H.L. (2007) *"Buddhist monks and Ethnic Politics"* in Jayadewa Uyangoda ed. *Religion in Context : Buddhism and Socio Political Change in Sri Lanka.* Colombo, Social Scientist Association.

____________ 2001. *"Buddhist Monks and Ethnic Politics : A War Zone in an Island Paradise". Anthropology* Today. Volume17(April):15-21

____________ (2001) *The Work of Kings: The New Buddhism in Sri Lanka.* Chambersberg, Amina Bokks

____________ (1978) *Rituals of the Kandiyan State,* Cambrige, Cambrige Univesity Press

Silva, Premakumara De. (2007) *"Hindu andMuslim connections to Sri Pada".* In Jayadewa Uyangoda ed. *Religion in Context : Buddhism and Socio Political change in Sri Lanka.* Colombo, Social Scientist Association

Uyangoda, Jayadewa (ed). (2007) *Religion in Context Buddhism and Socio Political Change in Sri Lanka'* Colombo, Social Scientists Association

Veblen,Thorstein. 1899. *The Theory of Leisure Class.* Available : http//:en. wikipedia.org/wiki/The_Theory_of_the_leisure_class.Accessed on :25/10/2010

Yalman, Nur. 1967. *Under the Bo Tree: Studies in Caste, Kinship, and Marriage in the Interior of Ceylon.* Berkeley: University of California Press